# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
## වෘත්තීය අධ්‍යාපන අංශය
# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

## පුරප්පාඩු

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. ප්‍රධාන ඉංජිනේරු - නිෂ්පාදන, සේවා හා නඩත්තු - (HM 1-1) තනතුරු 01

**සුදුසුකම්:-**

**බාහිර:-**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක මෝටර් කාර්මික/ යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව උපාධියක් ලබා තිබීම සමග අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (විද්‍යාපති) ලබා තිබීම හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක සාමාජිකත්වය ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමෙහි අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ සාමාජිකත්වය (Fellow Membership) ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමෙහි අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර:-**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ආ) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක කළමනාකරණ (MM) සේවා ගණයෙහි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
HM 1-1 - රු. 140,640 - 4100x15 -202,140/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)
2026.01.01 දිනට ගෙවන වැටුප - රු. 123,019.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොඅඩු හා 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාවක් අදාල නොවේ.

### 02. ප්‍රධාන ඉංජිනේරු - පුහුණු - (HM 1-1) - තනතුරු 01

**සුදුසුකම්:-**

**බාහිර:-**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක මෝටර් කාර්මික/ යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාලව උපාධියක් ලබා තිබීම සමග අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (විද්‍යාපති) ලබා තිබීම හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක සාමාජිකත්වය ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමෙහි අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

(ආ) පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ සාමාජිකත්වය (Fellow Membership) ලබා තිබීම සහ රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමෙහි අවම වශයෙන් වසර 15 ක සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර:-**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ආ) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක කළමනාකරණ (MM) සේවා ගණයෙහි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
HM 1-1 - රු.140,640 - 4,100x15 - රු.202,140/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනාවන් සඳහා හිමිකම් ලබයි)
2026.01.01 දිනට වැටුප - රු. 123,019.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොඅඩු හා 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාවක් අදාල නොවේ.

### 03. සැලසුම් නිලධාරී - (JM 1-1) - තනතුරු 01

**සුදුසුකම්:-**

**බාහිර:-**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක රාජ්‍ය පරිපාලන, ව්‍යාපාර පරිපාලන හෝ ආර්ථික විද්‍යා උපාධියක් සමග රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ ධාරිතාවයෙහි සැලසුම්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර:-**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ආ) කළමණාකරණ සහකාර - තාක්ෂණ නොවන (MA 1-2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග සැලසුම්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රයේ වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
JM 1-1 - රු. 72,650 - 1360x10-2040x18 -122,970/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)
2026.01.01 දිනට ගෙවන වැටුප - රු. 65,633.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

තරඟකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

### 04. අධ්‍යක්ෂ/විදුහල්පතිගේ ලේකම් - (JM 1-1) - තනතුරු 01

**සුදුසුකම්:-**

**බාහිර:-**

(අ) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය එකවර සිංහල/දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයන් 04 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සමත් වීම සහ පොලිටෙක්නිකල්/ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA)/ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) යන ආයතන වලින් ලේකම් පරිචය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමග අවම වශයෙන් වසර දහය (10) ක ලේකම් කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම. ඉන් වසර තුන (03) ක් පුද්ගලික සහකාර/ රහස්‍ය කටයුතු ලේකම් ලෙස රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සේවය කර තිබිය යුතුවේ.

(ආ) ඉංග්‍රීසි භාෂාව ලිවීම සහ කථා කිරීම පිළිබඳ මනා හැකියාවක් තිබීම සහ පරිගණක සාක්ෂරතාවය තිබීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) දෙමළ භාෂාව කියවීමට, ලිවීමට හා තේරුම් ගැනීමට ඇති ප්‍රවීනතාව අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර:-**

(අ) බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ආ) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක කළමණාකරණ සහකාර - තාක්ෂණ නොවන (MA 1-2) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග ලේකම් පරිචය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සහ ඉංග්‍රීසි භාෂාව ලිවීම කථා කිරීම සහ පරිගණක සාක්ෂරතාවය තිබීම අත්‍යාවශ්‍ය වේ.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
JM 1-1 - රු. 72,650 - 1360x10-2040x18 -122,970/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි)
2026.01.01 දිනට ගෙවන වැටුප - රු. 65,633.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**සියළුම තනතුරු සඳහා අදාල පොදු කොන්දේසි -**

- සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරුවලට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු/ඇය එම කාලසීමාව අවසානයේ දී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් වසර 01 ක වැඩ බලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරුවලට බඳවා ගැනීම් අදාල තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 08 ක් අයකර ගනු ලබන අතර ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් වේ.

අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
(ඈ) ජාතික හැඳුනුම්පත

විමසිය හැකි දෙදෙනෙකු ඇතුලත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමග **2026.06.07 දිනට ප්‍රථම කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහල වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර නිවැරදිව සඳහන් කල යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ - විදුහල්පති,**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,**
**අංක 582, ගාලු පාර,**
**ගල්කිස්ස.**